# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2364/40 - 2023 දෙසැම්බර් මස 31 වැනි ඉරිදා - 2023.12.31

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.-බී 10/2023

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව**

41උ (3) වන ව්‍යවස්ථාව යටතේ සාදනු ලබන රීති

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ආ, 41ඇ, 41ඈ සහ 41ඉ වන ව්‍යවස්ථා සමග කියවනු ලැබිය යුතු, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41උ වන ව්‍යවස්ථාවේ (3) වන අනුව්‍යවස්ථාව යටතේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව විසින් සාදනු ලබන නියෝග.

සභාපතිවරයා,
ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව.

2023 දෙසැම්බර් මස 31 වැනි දින,
කොළඹ දී ය.

**රීති**

1. මේ රීති 2023 අංක 1 දරන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ රීති යනුවෙන් හඳුන්වනු ලැබේ.

***1 වන කොටස***

**මහ ලේකම්වරයා සහ නිලධරයන් පත් කිරීම**

2. (1) (මෙහි මින්මතු "සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව විසින් -

(*අ*) (මෙහි මින්මතු "මහ ලේකම්වරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) මහ ලේකම්වරයකු; සහ

(*ආ*) සභාව විසින් අවශ්‍ය යයි සලකනු ලැබිය හැකි යම් නිලධරයන්,

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ප්‍රකාරව එහි කර්තව්‍ය ඉටු කිරීම සඳහා 41ඇ වන ව්‍යවස්ථාවේ (1) වන සහ (2) වන අනුව්‍යවස්ථා යටතේ සභාවට පත් කරනු ලැබිය යුතු ය.

(2) මහ ලේකම්වරයාට උපාධියක් සහ නීතිඥවරයකු වශයෙන් වසර විස්සක පළපුරුද්ද තිබිය යුතු අතර, එම උපාධිය පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් නීතිය පිළිබඳ උපාධියක් වීම වඩාත් සුදුසු ය.

*2 වන කොටස*

**මහ ලේකම්වරයාගේ කර්තව්‍ය**

3. මහ ලේකම්වරයා විසින්,-

(*අ*) 2 වන රීතියේ (1) වන ඡේදයේ නිශ්චිතව දක්වා ඇති පරිදි සභාව විසින් පත්කරන ලද සභාවේ නිලධරයන් සම්බන්ධයෙන් විනය පාලනය ක්‍රියාත්මක කිරීම ;

(*ආ*) සිය කර්තව්‍ය ඉටු කිරීමේ දී, සභාව විසින් නිශ්චය කරනු ලබන පරිදි වූ සභාවේ නිලධරයන්ගේ සේවා නියම සහ කොන්දේසි සැලකිල්ලට ගැනීම ;

(*ඇ*) සභාවේ සභාපතිවරයාගේ විධානය මත, සභාවේ රැස්වීම් කැඳවීම සහ එම රැස්වීම් පැවැත්වීම සඳහා පහසුකම් සැලසීම ;

(*ඈ*) එම රැස්වීම්වල සටහන් සහ වාර්තා පවත්වාගෙන යාම ;

(*ඉ*) සභාවේ තීරණ අදාළ අධිකාරීන් වෙත සන්නිවේදනය කිරීම ; සහ

(*ඊ*) සභාව විසින් ඔහුට පවරනු ලැබිය හැකි පරිදි වූ වෙනත් යම් කර්තව්‍යය ඉටු කිරීම,

කරනු ලැබිය යුතු ය.

*3 වන කොටස*

**සභාවේ කර්තව්‍ය**

4. සභාව විසින් -

(*අ*) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ආ වන ව්‍යවස්ථාවේ (3) වන අනුව්‍යවස්ථාවේ නිශ්චිතව දක්වා ඇති නියමයන් සැලකිල්ලට ගනිමින්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ආ වන ව්‍යවස්ථාවේ උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති එක් එක් කොමිෂන් සභාවට සභාපතිවරයා සහ සාමාජිකයන් වශයෙන් නිසි හා යෝග්‍ය තැනැත්තන් පත් කිරීමට ජනාධිපතිවරයාට නිර්දේශ කිරීම ;

එසේ වුව ද, එකී යම් කොමිෂන් සභාවක සභාපතිවරයා සම්බන්ධයෙන් වන අවස්ථාවක, සභාව විසින් තැනැත්තන් තුන්දෙනෙකු නිර්දේශ කරනු ලැබිය යුතු ය ;

(*ආ*) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙ 41ඇ වන ව්‍යවස්ථාවේ උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති යම් ධුරයක් සඳහා පත් කරනු ලැබිය යුතු තැනැත්තන් සම්බන්ධයෙන් ජනාධිපතිවරයා විසින් කරන ලද නිර්දේශ සලකා බැලීම සහ එම නිර්දේශ අනුමත කිරීම හෝ අනුමත නොකිරීම ; සහ

(*ඇ*) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හෝ වෙනත් යම් ලිඛිත නීතියක් මගින්, කලින් කල, සභාව වෙත පනවනු ලැබිය හැකි හෝ පවරනු ලැබිය හැකි පරිදි වූ වෙනත් යම් කාර්ය සහ කර්තව්‍ය ඉටු කිරීම සහ කිරීම,

කරනු ලැබිය යුතු ය.

*4 වන කොටස*

**සභාවේ රැස්වීම්**

5. (1) සභාව විසින්, එහි රැස්වීම් සභාව විසින් නිශ්චය කරනු ලැබිය හැකි පරිදි, පෞද්ගලිකව රැස්වීම මගින් හෝ යම් විද්‍යුත් මාධ්‍යක් මගින් හෝ අතථ්‍ය මාධ්‍යක් මගින් හෝ දෙමුහුන් මාධ්‍යයක් මගින් පවත්වනු ලැබිය හැකි ය ;

එසේ වුව ද, සභාව මගින්, අවශ්‍ය අවස්ථාවන් හි දී, සභාවේ යම් සාමාජිකයකුට එහි යම් රැස්වීමකට පෞද්ගලිකවම සහභාගී වන ලෙසට නියම කරනු ලැබිය හැකි ය.

(2) සභාව විසින්, සභාව විසින් සලකා බලනු ලැබිය යුතු යම් කාරණාවක් පිළිබඳ තීරණයකට එළඹීමට පෙරාතුව එකී කාරණය සම්බන්ධයෙන් අදාළ සියලු ම කරුණු සහ අවස්ථානුගත කරුණු සලකා බලනු ලැබිය යුතු අතර, එකී යම් තීරණයක් සඳහා වන හේතු වාර්තා කළ යුතු ය.

6. (1) සභාව විසින්, තැනැත්තකු, 41ආ වන ව්‍යවස්ථාවේ උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති යම් කොමිෂන් සභාවකට පත් කරනු ලැබීම සඳහා නිසි සහ යෝග්‍ය තැනැත්තකු ද යන්න නිශ්චය කිරීමේ දී, -

(*අ*) එකී තැනැත්තන්ගේ අවංකභාවය සහ කීර්තිය ;

(*ආ*) එකී තැනැත්තන්ගේ සදාචාරාත්මක පැවැත්ම ;

(*ඇ*) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ආ වන ව්‍යවස්ථාවේ උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති කොමිෂන් සභා විසින් සිදු කරගෙන යනු ලබන කටයුතුවල ස්වභාවයට අදාළව එකී තැනැත්තන්ගේ පළපුරුද්ද, සුදුසුකම් සහ ශක්‍යතාව; සහ

(*ඈ*) එකී කොමිෂන් සභාවේ සභාපතිවරයා හෝ යම් සාමාජිකයකු වශයෙන් එකී තැනැත්තන් විසින් යම් කාර්යයක් හෝ කර්තව්‍යයක් ඉටු කිරීමට බලපෑ හැකි එකී තැනැත්තන්ගේ ගැටුම් සහගත සබඳතා,

පිළිබඳ සැලකිල්ලට ගත යුතු ය.

(2) සභාව විසින්, (1) වන ඡේදයේ (අ) සිට (ඈ) දක්වා වන අනුඡේදවල නිශ්චිතව දක්වා ඇති නිර්ණායක ඇගයීමේ දී, එවැනි යම් කොමිෂන් සභාවක් වෙත නිර්දේශ කරනු ලබන තැනැත්තන් සම්බන්ධයෙන් සභාව විසින් නියම කරනු ලැබිය හැකි තොරතුරු ලබා ගැනීම සඳහා, අදාළ යම් තැනැත්තකු, වෘත්තීය මණ්ඩලයක් හෝ වෙනත් අධිකාරියක් විමසනු ලැබිය හැකි ය.

(3) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41උ වන ව්‍යවස්ථාවේ (2) වන අනුව්‍යවස්ථාවේ නිශ්චිතව දක්වා ඇති පරිදි, වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ සභාව වෙත පනවා ඇති හෝ පවරා ඇති යම් කාර්යයක් හෝ කර්තව්‍යයක් සම්බන්ධයෙන් වන විට, සභාව විසින්, එම කාර්යය හෝ කර්තව්‍යය එකී ලිඛිත නීතියේ නිශ්චිතව දක්වා ඇති කාර්යපටිපාටිය සහ ආකාරය අනුව ඉටු කිරීම හෝ කිරීම කළ යතු ය.

7. (1) (*අ*) සභාව විසින්, *ගැසට්* පත්‍රයේ සහ සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂාවලින් ශ්‍රී ලංකාව තුළ පුළුල් වශයෙන් සංසරණය වන අවම වශයෙන් දිනපතා පුවත්පත් තුනක පළ කරනු ලබන දැන්වීමක් මගින්, ආණ්ඩුක්‍රම ව්‍යවසථාවේ 41ආ වන ව්‍යවස්ථාවේ උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති යම් කොමිෂන් සභාවක සභාපතිවරයා වශයෙන් සහ සාමාජිකයන් වශයෙන් නිර්දේශ කරනු ලැබිය යුතු නිසි හා යෝග්‍ය තැනැත්තන්ගෙන් අභිලාශය ප්‍රකාශ කිරීම කැඳවිය යුතු ය.

(*ආ*) සභාව විසින්, එකී අයදුම්කරුවන්ට, එම දැන්වීමේ නිශ්චිතව දක්වා ඇති පරිදි වූ කාලසීමාවක් තුළ, සභාව විසින් නියම කරනු ලැබිය හැකි යම් තොරතුරු හෝ ලේඛන සභාව වෙත ඉදිරිපත් කරන ලෙසට නියම කරනු ලැබිය හැකි ය.

(2) (1) වන ඡේදය යටතේ යම් අයදුම්පත්‍රයක්, සභාව විසින් නියම කරන ලද යම් තොරතුරු සහ ලේඛන ලැබුණු විට, එකී තැනැත්තා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ආ වන ව්‍යවස්ථාව ප්‍රකාරව නිර්දේශ කරනු ලැබීම සඳහා නිසි හා යෝග්‍ය තැනැත්තකු ද යන්න සොයා දැන ගැනීම සඳහා සභාව විසින්, එම තැනැත්තන්ගේ යෝග්‍යතාව තක්සේරු කරනු ලැබිය යුතු ය.

(3) සභාව විසින්, මේ රීතියේ නිශ්චිතව දක්වා ඇති පරිදි නිර්දේශ කරනු ලැබිය යුතු තැනැත්තන්ගේ යෝග්‍යතාව තක්සේරු කිරීමෙන් පසුව, එසේ යෝග්‍යතාව තක්සේරු කරන ලද තැනැත්තන්ගේ කෙටි ලේඛනයක් සකස් කරනු ලැබිය යුතු අතර, ඔවුන්ගේ යෝග්‍යතාව තහවුරු කර ගැනීම සඳහා ඔවුන්ට සම්මුඛ පරීක්ෂණයක් පවත්වනු ලැබිය යුතු ය.

(4) සභාව විසින්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ආ වන ව්‍යවස්ථාව ප්‍රකාරව සභාව විසින් නිර්දේශ කරන ලද තැනැත්තන්ගේ නම්, සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවලින් ශ්‍රී ලංකාව තුළ පුළුල් වශයෙන් සංසරණය වන අවම වශයෙන් දිනපතා පුවත්පත් තුනක, පළ කරනු ලැබිය යුතු ය.

8. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ඇ වන ව්‍යවස්ථාව යටතේ ජනාධිපතිවරයා විසින් කරනු ලබන යම් නිර්දේශයක් සභාව විසින් අනුමත නොකරනු ලබන අවස්ථාවක දී, සභාව විසින්, එහි තීරණය එකී තීරණය සඳහා වන හේතූන් සමඟ ජනාධිපතිවරයා වෙත දැනුම් දෙනු ලැබිය යුතු ය.

9. සභාව විසින් සාදනු ලබන රීති, එම රීති, සභාව විසින් සාදන ලද ආකාරයෙන් ම, කලින් කල, සංශෝධනය කිරීම, වෙනස් කිරීම හෝ ඉවත් කිරීම කරනු ලැබිය හැකි ය.

EOG 01- 0032

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.